# කොවිඩ් 19 ව්‍යාප්තිය වළක්වමින් පොදු මහජන සහ වෘත්තිය ක්‍රියාකාරකම් සිදුකරන ආකාරය පිලිබඳව උපදෙස්

පොදු මහජන සහ වෘත්තිය ක්‍රියාකාරකම් සඳහා උපදේශ සටහන් ලබා දී ඇත. සංචාරක සේවා, විශාල සාප්පු සංකීර්ණ, උත්සව කළමනාකරණය වැනි සමහර අංශවලට උපදෙස් සටහන් කිහිපයක් අදාළ වේ.

මෙම උපදෙස් කාර්යයන් නැවත ආරම්භ කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ලබා දී ඇති සමස්ත අවසරයට යටත් වේ (මුළුමනින්ම / තෝරාගත්).

සෑම උපදෙස් සටහනක්ම සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශයේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරනු ලබයි. COVID-19 සම්ප්‍රේෂණය වැළැක්වීම සඳහා අනුගමනය කළ ක්‍රියාමාර්ග ආයතන හිමිකරු / වගකිවයුතු පුද්ගලයා වෙත ඉදිරිපත් කර ඇත.

නව ජීවන රටාවක් උදෙසා
புதிய வாழ்க்கை முறையை நோக்கி
TOWARDS A NEW NORMAL

MINISTRY OF HEALTH AND INDIGENOUS MEDICAL SERVICES

World Health Organization

GOVERNMENT MEDICAL OFFICERS ASSOCIATION

SRI JAYAWARDENEPURA KOTTE MUNICIPAL COUNCIL

# 28. ඉදිකිරීම් ස්ථාන

රටේ විවිධ ප්‍රදේශවලින් කම්කරුවන් පැමිණ ඉදිකිරීම් කටයුතුවල විවිධ කාර්යයන් වල නිරත වන්නේ මෙම ස්ථානවලය. ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් අවම සනීපාරක්ෂක පහසුකම් සහිතව මාස ගණනක් මෙම ස්ථානවල රැඳී සිටිති.

නිශ්චිත උපදෙස්

**සේවා යෝජකයන්**

- ප්‍රමාණවත් සනීපාරක්ෂක සැපයුම් තිබිය යුතුය (උදා: මුහුණු ආවරණ, උෂ්ණත්වමාන, විශාල වැඩබිම් වල, විෂබීජ නාශක, සබන්, ජල සැපයුම).
- කම්කරුවන්ගේ සංඛ්‍යාව හැකිතාක් සීමා කිරීමට කටයුතු කරන්න.
- සේවකයින් පදිංචි වී සිටින ප්‍රදේශය සහ අනෙකුත් තොරතුරු සඳහන් වන ලැයිස්තුවක් සකස් කරන්න.
- වැඩබිමට ඇතුළුවීමේ දී උෂ්ණත්වය පරික්ෂා කිරීමට හෝ ශ්වසන රෝග ලක්ෂණ ගැන විමසීමක් කරන්න.
- සෞඛ්‍ය සම්පන්න හැසිරීම් පිළිබඳව කම්කරුවන් දැනුවත් කරන්න.
- හැකි නම්, නිසි වාතාශ්‍රය සහිත තාවකාලික නවාතැන් පහසුකම් සකසන්න.
- හැකි සෑම විටම අන් අය සමග ආයුධ, උපකරණ සහ බල මෙවලම් හවුලේ භාවිතය අවම කරන්න.
- හැකි අවස්ථාවන්හිදී ප්‍රමාණවත් දුරස්ථභාවයකින් යුතුව සේවා බිම සකස් කිරීම (සෑම විටම කළ නොහැකි විය හැක). දුරස්ථභාවය පවතවාගත නොහැකි අවස්ථාවලදී මුහුණු ආවරණ පැළඳීමට ඔවුන් දිරිමත් කරන්න.
- සබන් යොදා අත් සේදීම සඳහා ප්‍රමාණවත් පහසුකම් ලබා දීම.( පාදයෙන් / සංවේදකයක් හරහා ක්‍රියා කරන ජල කරාමයක් වඩාත් සුදුසු වේ).
- ඉදිකිරීම් ස්ථානවල ඇති සියළුම මදුරු අභිජනන වියහැකි තැන ඉවත් කිරීම.
- ශ්වසන රෝග ඇති කම්කරුවන් සොයාගැනීමට වැඩබිමේ වැඩපිළිවෙලක් සකස්කළ යුතුය.
- අභ්‍යන්තර සේවකයින්ගේ පිටවීම සහ බාහිර පුද්ගලයින් ඇතුළත් කිරීම පාලනය කිරීම මගින් ඇතුල් වන හා පිටවන කම්කරුවන් මිශ්‍ර වීම වැළැක්වීමට වගබලාගත යුතුය.
- කම්කරුවන් බුලත්විට හපන්නේ නැති බව හෝ පරිශ්‍රය තුළ දුම් පානය නොකරන බවට සහතික වන්න.
- ඉදිකිරීම් ස්ථානයේ ප්‍රමාණවත් වැසිකිළි පහසුකම් සකස් කිරීම.
- සෝපාන තිබේ නම්, එකිනෙකා අතර ආරක්ෂිත දුරක් පවත්වා ගැනීම සඳහා වරකට ගමන් කරන පුද්ගලයින් ගණන සීමා කරන්න.
- ලබා දී ඇති උපදෙස් වලට අනුකූල බව දක්වමින් ඔබ විසින් එකඟතා ප්‍රකාශය පිරවිය යුතුය. සම්පූර්ණ කරන ලද එකගතා ප්‍රකාශයේ මුල් පිටපත ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිවරයා වෙත යැවිය යුතුය. එහි පිටපතක් අදාළ පළාත් පාලන ආයතනයට (මහ නගර සභාව / නගර සභාව / ප්‍රාදේශීය සභාව) යැවිය යුතු අතර තවත් පිටපතක් තමන් සතුව තබා ගත යුතුය. ඉහත මාර්ගෝපදේශ දැඩි ලෙස පිළිපැදීම සහතික කිරීම හිමිකරු / භාරකරුගේ වගකීම වේ.

**සේවකයන්**

- නවාතැන් හා සෞඛ්‍ය තත්ත්වය පිළිබඳ නිවැරදි තොරතුරු අනාවරණය කළ යුතුය.
- වැඩබිම වෙත පිටත්ව යාමට පෙර සහ වැඩ මුරය අවසානයේ පිට වීමට පෙර අවම වශයෙන් තත්පර 20 ක් වත් සබන් යොදා දෑත් සේදිය යුතුය.
- සෑම විටම අන් අය සමඟ අවම වශයෙන් මීටර 1 ක පරතරයක් පවත්වා ගත යුතුය.
- නිතර නිතර මුඛය, නාසය හෝ ඇස් ස්පර්ශ නොකළ යුතුය.
- මුහුණු ආවරණ නිසි ලෙස පැළඳිය යුතු අතර පාවිච්චි කල මුහුණු ආවරණ වැසිය හැකි බඳුනකට පමණක් බැහැර කළ යුතුය.
- ඔබේ කෝප්ප, පිඟන්, රෙදි සහ තුවා පොදුවේ පාවිච්චි නොකළ යුතුය.
- ඉදිකිරීම් භූමිය තුළ හෝ පිටත කිසිදු රැස්වීමක් සංවිධානය කිරීම හෝ සහභාගී නොවිය යුතුය.
- ඉදිකිරීම් භූමියේ කෙළ ගැසීමෙන් වැළකී සිටිය යුතුය.

- කැස්ස හෝ කිවිසුම් යන විට වැලමිටේ ඇතුළත පැත්තෙන් ඔබේ නාසය සහ මුඛය ආවරණය කළ යුතුය.
- ඔබට ශ්වසන රෝග ලක්ෂණ ඇත්නම් ඉදිකිරීම් ස්ථානයට යාමෙන් වලකීසිටිය යුතුය.
- දුම් පානයෙන් හා මත්පැන් පානය කිරීමෙන් වළකින්න.

**නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා පිළිවෙල**

- බිත්තියේ දැන්වීම් භාවිතා කරමින් හා සියලුම සේවකයින්ට දැකිය හැකි ස්ථානවල සෞඛ්‍ය පණිවිඩ, වැඩබිමට ඇතුල්වීමේ ස්ථානයේ හෝ සේවයේ යෙදෙන ස්ථානයේ ප්‍රදර්ශනය කළ හැකිය.
- COVID-19 පැතිරීම පිළිබඳව සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කළ ගොඩනැගිලි හා ඉදිකිරීම් කර්මාන්තය පිළිබඳ මාර්ගෝපදේශයන් අඩංගු උපදෙස් විස්තර බලන්න.




සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

28/05/2020